<u>වගා සහනාධාර චක්‍රලේඛ අංක 22'</u>

මගේ අංකය: සං/ව.ආ/ප්‍රති III
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
තැ.පෙ.1474,
කොළඹ.03.
1989.10.19

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් සහ
තේ පරි/ව්‍යාප්ති නිලධාරින් වෙත.

තේ වගා සහනාධාර අත්තිකාරම් ක්‍රමය
උපරිම බිම් සීමාව

---

තේ නැවත වගාව සහ අලුත් වගාව සඳහා දැනට ක්‍රියාත්මකවන සහනාධාර අත්තිකාරම් ක්‍රමය මත අවසර දෙනු ලබන උපරිම බිම් ප්‍රමාණය හෙක්ටයාර් 2 කි. එහෙත් හෙටයාර් 02 කට වඩා වැඩි ඉඩම්ද මෙම ක්‍රමය යටතේ සහභාගිවීමට ඉල්ලුම් කරන බව පෙනී ගොස් ඇත.

02. මෙහිදී බිම් ප්‍රමාණය හෙක්ටයාර් 02 කට වැඩියෙන් ඉල්ලුම් කරන අවස්ථාවලදී පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට පුලුවන.

(I) හෙක්ටාර් 02 කට වැඩි ආසන්න බිම් ප්‍රමාණ සඳහා හෙක්ටයාර් 02 දක්වා අත්තිකාරම් ක්‍රමය යටතේ අවසරදීම සහ ඉතිරි කොටස සාමාන්‍ය සහනාධාරය යටතේ අවසරදීමට පුලුවන.

(II) හෙක්ටයාර් 02 කට ඉතා අධික (උදා :- හෙක්. 03 ට වැඩි) බිම් ප්‍රමාණ සඳහා සහනාධාර ණය ක්‍රමය හඳුන්වාදීමට පුලුවන.

ණය ක්‍රමය යටතේ සහභාගිවීමට අදහස් නොකෙරේ නම්, හෙක්ටයාර් 02 දක්වා අත්තිකාරම් ක්‍රමයද ඉතිරි බිම් ප්‍රමාණය සාමාන්‍ය සහනාධාර ක්‍රමය යටතේ ද කටයුතු කිරීමට අවසරදීම කළ හැකිය.

ආචාර්ය සරත් බී මනනවත්ත
සභාපති

ශ්‍රී/10/19